# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2394/65 - 2024 ජූලි මස 26 වැනි සිකුරාදා - 2024.07.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. -21/78 (XV) (බී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සහ 139 වන වගන්තිය සමග කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත් වන මා විසින්, විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින් එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු වන, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ පීඨයන් හා අධ්‍යයනාංශයන් නිශ්චිතව දක්වමින් (කලින් කළ සංශෝධිත) 2007 ඔක්තෝබර් මස 09 වන දින අංක 1518/15 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද නියමයේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) 2022 අගෝස්තු මස 16 වන දින අංක 2293/22 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති උපලේඛනයේ I වන තීරයේ සඳහන් ''ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් ප්‍රාසාංගික සහ දෘශ්‍ය කලා පීඨය'' යන අයිතමය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන සටහන එකතු කිරීමෙන් :-

''ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් දෘශ්‍ය සහ ප්‍රාසාංගික කලා පීඨය''

(2) එහි උපලේඛනයේ I වන තීරයේ සඳහන් ''ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් ප්‍රාසාංගික සහ දෘශ්‍ය කලා පීඨය'' යන අයිතමය සහ එහි II වන තීරයේ අනුරූප සටහන් වලට ඉක්බිතිව ම පහත සඳහන් නව පීඨය හා අධ්‍යයනාංශයන් ඇතුළත් කිරීමෙන්:-


1A - PG 6790 — 455 (2024/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *I වන තීරය* | *II වන තීරය* |
| --- | --- |
| ''සිද්ධ වෛද්‍ය පීඨය | 1. මූලත්තත්තුවම් අධ්‍යයන අංශය<br>2. ගුණපාඩම් අධ්‍යයන අංශය<br>3. නෝයිනාඩල් චිකිස්සෛ අධ්‍යයන අංශය<br>4. ළමා හා ස්ත්‍රී වෛද්‍ය අධ්‍යයන අංශය<br>5. ශීර්ෂරෝග සහ ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශය<br>6. ප්‍රජා වෛද්‍ය සමූහ නල මරුත්තුවම් අධ්‍යයන අංශය<br>7. මානව ජීව විද්‍යාව අධ්‍යයන අංශය<br>8. විෂ විද්‍යාව සහ පාරම්පරික වෛද්‍ය ක්‍රම අධ්‍යයන අංශය''; |

(3) එහි ''ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් ප්‍රාසාංගික සහ දෘශ්‍ය කලා පීඨය'' යනුවෙන් සඳහන් වන සෑම සටහනක් ම, නිවේදනයක් ම, ගිවිසුමක් ම, සන්නිවේදනයක් ම, එකඟතාවක් ම, අයදුමක් ම හෝ ලේඛනයක් ම ''ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් දෘශ්‍ය සහ ප්‍රාසාංගික කලා පීඨය'' ලෙස සකසා කියවා තේරුම් ගත යුතු ය.

(4) මෙම නියමය ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව 2022 අගෝස්තු මස 16 වන දින අංක 2293/22 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් ''ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් ප්‍රාසාංගික සහා දෘශ්‍ය කලා පීඨය'' වෙත පවරනු ලැබූ යම් බලතල, කාර්ය සහ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම ''ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් දෘශ්‍ය සහ ප්‍රාසාංගික කලා පීඨය'' මගින් සියලු කාර්ය සඳහා වලංගු ලෙස සිදු කරන ලද ක්‍රියාත්මක කිරීමක් සහ ඉටු කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

**ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත්,**
අධ්‍යාපන අමාත්‍ය.

2024 ජූලි මස 25 වන දින,
කොළඹ දී ය.

EOG 07 - 0267

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.